# ගමරාළයි සුදු අලියයි

එසර අටක් ? පොඩි කාලයකුත් නෙවෙයි; ලොකු කාලයකුත් නෙවෙයි. පොඩි කාලයක් විදියට හිතුවොත් ඒ පොඩි කාලය ඇතුලත කරපු වැඩ කොටස ලොකුයි නම් ? ලොකු කාලයක් විදියට හිතුවොත් ඒ ලොකු කාලය ඇතුලත කළේ අපේ පොඩි අයට කියන්න බැරි තරම් වටිනා සේවයක් නම් ?

අපි මේ කතා කරන්නේ කුසුම්සිරි ලියනාරච්චි සහ යශෝධරා සරච්චන්ද්‍ර කලාකරුවන් දෙපළ ගැන. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ කලා අසපුවේ ඉපදිලා හැදුන වැඩුන එතුමන්ගේ සුජාත දියණිය යශෝද්‍රාවන් ගැන අමුතුවෙන් හඳුන්වා දෙන්න ඕන නෑ. ඒ වාගේ ම තවත් කලාකාමී පවුලක සාමාජිකයෙකු වන කුසුම්සිරි රංගනවේදියාණන් ගැනත් දිගින් දිගට ලියන්න අවශ්‍ය නෑ. මේ දෙපළ මෙල්බන් නුවර පවත්වාගෙන යන "ශ්‍රී ලංකන් තියටර් ගෲප්, මෙල්බන්"ඃරමස ඕබන්බ ඔයඨඑැර ධරදමචල එැකඉදමරබැ*" අපේ පොඩි දරුවන්ට පහුගිය අවුරුදු අට තිස්සේ කළේ ලොකු සේවයක්. ඔවුන්ට රංගනවේදය, නර්තනය, ගායනය වාගේ කලාංග උනුසාරයෙන් අපේ සිංහලකම කවන්නට අදටත් දරන උත්සාහය අපි අගය කරන්න ඕන. ඉතින් ඔවුන් අළුතින්ම ඉදිරිපත් කරන වේදිකා නිර්මාණය ගැන කතා කරන්නට අපි කුසුම්සිරි ලියනාරද්දි කලාකරුවාණන්ව දුරකථනයෙන් සම්බන්ධ කරගත්තා.

"අපි මෙහේ පදිංචියට ආවේ 2006 දී . ඉතින් 2007 මුල තමයි අපේ මේ "ශ්‍රී ලංකන් තියටර් ගෲප්" එකේ වැඩමුළු පවත්වන්න පටන් ගත්තේ." කුසුම්සිරි තමන්ගේ මුල මතක් කළා.

"ඉතින් එදා අපිත් එක්ක සම්බන්ධ වුණා බොහෝමයක් දරු දැරියෝ අදටත් අපි එක්ක ඉන්නවා. එදා ඒ අය පොඩි අය. ඒ වුණාත් දැන් ඒ අය ලොකු මහත් වෙලා. ජී.සී.ඊ. විභාගයට පෙනී




හිටින අය, විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබන අය මේ අතරෙ ඉන්නවා. අපි මේ දරුවන් වෙනුවෙන් අවුරුද්දෙන් අවුරුද්දට කරගෙන ආ වැඩමුළු වගේම ඒ තුළින් නිර්මාණය වුණ නාට්‍යයන් ඒ අයට ගැලපෙන්න ඒ ඒ අවුරුද්දෙ වෙනස් කරමින් තමයි ඉදිරිපත් කරන්න වුණේ."

දරුවන් වෙනුවෙන් කැපවෙලා කරන මේ සද්කාර්යයට කුසුම්සිරිටත් යශෝද්‍රාටත් යම්කිසි අරමුණක් තියෙනවා.

"අපි ඉගෙනගත්ත අපේ ශ්‍රී ලාංකික දේවල් අද අපේ අතින් ගිලිහී යමිනුයි තියෙන්නේ. ලංකාවේ ඉන්න තරුණ, ප්‍රවීණ නාට්‍යකරුවන්ගේ අවධානයෙනුත් ගිලිහී යන අපේ රංග ශෛලීන්වල ඇසුර මෙහේ ඉන්න අපේ දරුවන්ට ලබාදෙන එක අපේ එක අරමුණක්. සුපුරුදු විදියට පාඩම්වලින් හරි වෙනත් මාධ්‍යවලින් හරි මේ සංස්කෘතික අංග හදනවට වැඩිය නාට්‍යානුසාරයෙන් ඒවා මේ දරුවන්ට අත් විඳින්න දෙනකොට ඒකෙන් සාර්ථක ප්‍රතිඵල ලැබෙනවාය කියන එකයි අපේ අදහස."

අපි කොහොමද ඉතින් ඒ සාර්තක ප්‍රතිඵල දකින්නෙ ?. අපි උනන්දු වුණා ඒ ගැන.

"ඇත්තටම අපි දෙන්නා අම්මා තාත්තා වගේ වෙලයි තියෙන්නෙ මේ දරුවන්ට. දැන් අපි ඒ අයට ඒ අයගේ දෙවල් ඉදිරිපත් කරන්න වේදිකාව නිර්මාණය කරලයි තියෙන්නෙ. ගිය පාර හසිනි ඉළංගරත්න දැරිය නාට්‍යයක් රචනා කරලා ඉදිරිපත් කළා අධ්‍යක්ෂණයත් එයාගෙමයි. ඉංග්‍රීසි බසින් මේ කටයුතු කරන එක මේ දරුවන්ට පහසු නිසා ඉංග්‍රීසියෙන් කළා වුණාත් ඒ තුළ තිබුණේ අපෙන් උකහාගත්ත අපේ දේවල්. හසිනිට විතරක් නෙවෙයි ඒ ඉදිරිපත් කිරීමට දායක වුණ හැමෝටම ඒක හොඳ තෝතැන්නක් වුණා තමන්ගේ හපන්කම් පෙන්නන්න."

අපි "ගමරාළයි සුදු අලියයි" කියන "ශ්‍රී ලංකන් තියටර් ගෲප්, මෙල්බන්" කණ්ඩායමේ අළුත්ම වේදිකා නිර්මාණය ගැන අහමු.

"ගමරාළ දිව්‍යලෝකෙ ගිය හැටි කියන අපේ ජනකතාව පදනම් කරගෙනයි මම මේ පිටපත ලිව්වෙ. යශෝධරා තමයි සංගීතය නිර්මාණය




කළේ. ඉතින් මේක අපේම නිශ්පාදනයක්. අපේ ම කියන රංගන ශෛලීන් තුළින් අපේ ම ජන සංස්කෘතිය අපේ දරුවන්ට හුරු කරවන්න කරන උත්සාහයේ තවත් පියවරක් කියන්න පුළුවන්."

"මේ වාගේ ඉංග්‍රීසි බස හසුරවන අපරදිග ජීවන රටාවකට හුරුවුණ අපේ දරුවන්ට තියෙන බාධක තමයි අපේ සිංහල භාෂාව වටහා ගැනීම, උච්චාරණය කිරීම වගේ දේවල්. ඉතින් ඒ බාධක මඟහරවාගෙන අපි මේ කටයුතු කරන්නෙ ලොකු අභියෝගවලට මූණ දෙන ගමන්. මේ නාට්‍යයේ ප්‍රධාන චරිත රඟපාන්නෙ කණ්ඩායමේ ඉන්න තරුණ පිරිස. පහුගිය අවුරුදු හත අට පුරාවට ම මේ අය ලබපු පන්නරය ප්‍රේක්ෂකයන්ට දැක ගන්න ලැබේවි මැයි තුන්වෙනිදාත් හතරවෙනිදාත් මෙල්බන් නුවර පැවැත්වෙන දර්ශන වාරවලදී. ඇත්තටම මේ දරුවන් අපේ සිංහල භාෂාව හසුරවමින් ඒ චරිතවලට පණ පොවන හැටි හරි අපූර්වත්වයක් දනවනවා."

දරුවන්ට මෙන්ම මේ දේ දරුවන් ලවා පුහුණු කරවලා ඉදිරිපත් කරවන අයටත් බාධක, අභියෝග තියෙනවා. කුසුම්සිරි ඒ ගැන කතා කරන්නේ මේ විදියට;

"බොහෝමයක් ශ්‍රී ලංකාවෙන් ආව අපේ අය අතරේ තියෙන දෙයක් තමයි ලංකාවේ සුප්‍රසිද්ධ නළු නිළියන් රඟපාන නාට්‍යවලට වැඩි අවධානයක් යොමු කිරීම. අපේ ළමයි එකතුවෙලා කරන දෙයක් තක්සේරු කරන්නේ වෙනම විදියකට. අපිට උපතින්ම එන ගතිත් තියෙනවානේ. "නිතර දකින කුකුලාගේ කරමළය පේන්නේ සුදුවට" කියල කතාවකුත් තියෙනවනේ අපේ අය අතරේම."

ලංකාවේ ශිල්පීන් ගෙන්වාගෙන කියන නිර්මාණ ඉදිරිපත් කිරීමේ ප්‍රවණතාව දවසින් දවස වැඩි වෙනවා. මෙහේ හැදෙන වැඩෙන, ජීවත් වෙන අයගේ නිර්මාණවලට එයින් ඇතිවෙන බලපෑමත් සැළකිය යුතු තරම්.

"ලංකාවෙන් පිටත අපේ අය වැඩිම පිරිසක් ඉන්නේ මෙල්බන් නුවර කියලනේ කියන්නේ. ඉතින් ඒ ඒ අයගේ අභිමතය පරිදි යන්න පුළුවන් විවිධ දේවල් තියෙන එක හොඳයි කියලයි මගේ නම් අදහස. ඒ ඒ දේවල් සංවිධානය කරන අයට දරාගන්න පුළුවන්නම් ඒකට කාටවත් දොසක් කියන්න බෑ. ඒත් අපි එක දෙයක් තේරුම් ගන්න ඕන. සමහර පිරිස් මේ දේවල් සංවිධානය කරන්නෙ ව්‍යාපාරයක් විදියට. තවත් සමහරක් ඉන්නවා, "අපිත් මෙහෙ ඉන්නවා" කියලා අනික් අයට දැනෙන්න. මොනවා හරි දෙයක් කරනවා. තමන්ගේ චරිතය ස්ථාපිත කරගන්න කෙසේ හෝ, මොනවා හෝ කරන අයයි ඒ. මේ දෙගොල්ලන්ම අදාල වෙන්නේ නෑ ඒ කරන දෙයින් සමාජයට මොකද වෙන්නෙ කියන එක.

"නමුත් තවත් පිරිසක් ඉන්නවා මොනවා හරි හොඳ පරමාර්ථයක් ඇතිව වැඩ කරන. ඒ අයට අවංකව ම ඕනකමක් තියෙනවා යහපත් දෙයක් කරන්න. එහෙම අයත් ගොඩක් මෙහේ ඉන්නවා."

"මොනවා වුණාත් ඔය කාටවත් ඇඟිල්ල දික් කරන්න අපට බෑ. මොකද විවිධ රසඥතා තියෙන අය ඉන්නවානේ. හැම දෙයක් ම සමබරව වෙනවානම් හොඳයි. ඒත් ඛේදවාචකය වෙලා තියෙන්නෙ සමබරතාව බිඳිලා තියෙන එකයි."

"විශේෂයෙන්ම නාට්‍යවේදීන් ලංකාවෙත් දුක් විඳිනවා. මොකද නාට්‍යවලට තියෙන ප්‍රේක්ෂකාගාරය බොහොම අල්පයි. මුළු ලෝකයේ ම සමාජයේ කඩා වැටීම තමයි ඒකට හේතුව. විශේෂයෙන් ම මේ වාගේ පරිසරයක හැදෙන දූ දරුවන්ට විශ්ව සාහිත්‍යයේ නිර්මාණ ඇසුරින් යමක් කරනවාට වඩා අපේම ජන සාහිත්‍යයේ සුවඳ, රස දෙන්නට හදන අපේ උත්සාහය ඔය කිව්ව පරිසර තත්ත්ව යටත්දී හරියට උඩුගං බලා පීනනවා වගේ දෙයක්."

මොනවා වුණාත් විනිශ්චය තියෙන්නේ ප්‍රේක්ෂක රසිකයින් අතේ. ඉතින් එක දෙයක් විතරක් හිතේ තියාගෙන අපේ නිර්මාණය එක්ක එකතුවෙන්න කියලා අපි ආදරයෙන් හැමෝටම ආරාධනා කරනවා. ඒ තමයි, මේ හපන්කම් පෙන්වන්නේ මෙහේ ඉපදුන, මෙහේ හැදුන වැඩුන දරුවන්ය කියන එක. ඒ විදියට හිතුවොත් තමයි අපේ ආරාධනය පිළි අරගෙන පිත් එක්වෙන කාට වුණාත් අපේ නිර්මාණයේ නියම අපූර්වත්වය විඳින්න පුළුවන් වෙන්නෙ."

මැයි මස තුන්වන හා හතරවන දෙදින මෙල්බන් නුවර ක්‍රැම්බර්න් හා ග්ලැඩ්ස්ටන් පාර්ක් ප්‍රදේශවල වේදිකාගතවන "ගමරාළයි සුදු අලියයි" නාට්‍යය සර්වප්‍රකාරයෙන් ම සාර්ථක වේවා ! යි කුසුම්සිරි, යශෝද්‍රා දෙපළ ඇතුළු " ශ්‍රී ලංකන් තියටර් ගෲප්, මෙල්බන්" කණ්ඩායමට සුභ පතමින් අපි කුසුම්සිරි ලියනාරච්චි කලාකරුවාණන්ට සමු දුන්නා.

**අවුරුදු උදානය 2014**

**වෙළඳ කුටි**

**6th April, Sassella Park, Deer Park**

**බටහිර වික්ටෝරියානු ශ්‍රී ලංකා බෞද්ධ සංගමය ඉදිරිපත් කරන "අවුරුදු උදානය" ජන ක්‍රීඩා, සංස්කෘතික සහ සංගීත සංදර්ශනයන්ගෙන් සමන්විත අති විශාල ශ්‍රී ලාංකික ජනතා සහභාගීත්වයෙන් පැවැත්වේ.**

**වෙළඳ කුටි සඳහා විමසන්න**

**නීල් - 0421 238 322**